නිෂ්පාදනයට ලබා දෙන දායකත්වය වැඩිවීම නිසා එය රටේ ජනතාව ගේ දුගීකම මැඩලීමට ද රටේ ණය බරින් නිදහස් වීමට, ආනයනය අවම කිරීම වැනි යහපත් තත්ත්වයන් ඇති කිරීමට අවස්ථාව ලබා දේ.

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වර්තමාන රජය විසින් මහින්ද චින්තන ප්‍රතිපත්ති මාලාව ඉදිරිපත් කර ඇත. එහිදී කෘෂිකර්ම අංශය මුහුණ පාන ප්‍රබල ගැටලු ලෙස ඵලදායීතාව අඩුවීම, නවීන තාක්ෂණික ක්‍රමවල හිඟකම, ප්‍රමාණවත් නොවන මූල්‍ය පහසුකම්, ලෝක වෙළඳ පොළට පිවිසුම් මාර්ග සීමිත වීම, ගුණාත්මක බීජවලින් පවත්නා හිඟකම ප්‍රධාන වේ. මේවාට පිළියම් ලෙස මහජනතාව ගේ ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම හා අපනයනය කිරීම සඳහා කෘෂි නිෂ්පාදනවල ධාරිතාව හා ඵලදායීතාව ඉහළ නැංවීම, දැනුම පදනම් කරගත් ගොවි සමාජයක් පිහිටුවීම, ඉල්ලුම සාම්ප්‍රදායික වන පරිදි පර්යේෂණ හා සංවර්ධන වැඩ සටහන් දියත් කිරීම, සැකසීම හා අගය එකතු කිරීම, අලෙවි පාලන ක්‍රම හඳුන්වා දීම ප්‍රධාන වේ.

ඕනෑම රටකට කෘෂිකාර්මික වශයෙන් ස්වයංපෝෂිත ස්ථාවරත්වයක් තිබිය යුතු ය. ජාතික, ජාත්‍යන්තර වශයෙන් රටකට හදිසියේ මුහුණ පෑමට සිදුවන අවිනිශ්චිත තත්ත්වයන් වලට මුහුණදීමේ දී කෘෂිකාර්මික අතින් සමෘද්ධිමත් ව සිටීම වැදගත් ය. ශ්‍රී ලංකාව වැනි ස්වාභාවික සම්පත් මෙන්ම මානව සම්පත් අතින් විෂමතාවක් ඇති රටකට එය තවත් අවස්ථාවකි. ජපානය වැනි රටවල් ස්වාභාවික සම්පත් අතින් දුර්වල වුවත් මානව සම්පත තාක්ෂණය යොදා ගෙන කෘත්‍රිම පරිසර තත්ත්වයන් යටතේ කෘෂි නිෂ්පාදන සිදු කරයි. මේ සඳහා මිනිසා ගේ ආධ්‍යාත්මය ද තරමකින් ප්‍රමෝදනය විය යුතු ය.

ශ්‍රී ලංකාවේ අපනයන කෘෂි කර්මාන්තය තුළ අපනයන සහ භෝග විවිධාංගීකරණයක් ඇති කිරීම වැදගත් ය. වර්තමාන කෘෂි සංවර්ධන වැඩසටහන්වල ආයෝජකයන් ඉක්මවා ලාභ ලබා ගැනීමට නම් ඒවා ඵල දරන තෙක් සංවර්ධන නිලධාරින් ගේ අවධානයට යොමුවිය යුතු ය.

මේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වීමේදී විශේෂයෙන්ම මධ්‍යගත සැලසුම් ප්‍රතිපත්තිවලට වඩා පහළ සිට ඉහළට ක්‍රියාත්මක වන සංවර්ධන ප්‍රවේශයක් යොදා ගැනීම ඉතා වැදගත් ය. මේ ආකාරයෙන් කුමන අංශයකින් රටක සංවර්ධනය සිදු වුවත් ඒ තුළින් ජනතාව ගේ තත්ත්වය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. ■

**හර්ෂනී පුෂ්පානි**



# ලොව ප්‍රථම නවකතාව

**ලො**ව ප්‍රථම නවකතාව ලෙස සැලකෙන්නේ මුරසකි ෂිකිබු ගේ ගෙන්ජි මොනොගතරි (Tale of Genji) කතාව ය. එය ක්‍රි.ව. 1007දී පමණ රචනා වූ කෘතියකැයි විශ්වාස කෙරේ. මේ කෘතියෙහි නවකතාවක අන්තර්ගත ලක්ෂණ වන ප්‍රධාන චරිතයක් පැවතීම හා ඒ වටා සෙසු චරිත රැසක් අන්තර්ගත වීම, චරිත නිරූපණය විශිෂ්ට මට්ටමක පැවතීම, සිද්ධි අනුපිළිවෙලකට සිදුවීම යනාදිය ඇතුළත් වේ. මේ කෘතියෙහි තිබෙන ප්‍රධාන විශේෂත්වය වන්නේ බොහෝ චරිතවලට නිශ්චිත නමක් දී නො තිබීමයි. ඒ වෙනුවෙන් චරිත හැඳින්වෙන්නේ ඔවුන් ගේ කාර්යය අනුව ය.

යසුනරි කවබත ගේ අදහස වන්නේ ගෙන්ජි කතා ජපාන සාහිත්‍යයේ කූටප්‍රාප්තිය සනිටුහන් කරන අතර වර්තමානයේ දීත් එය ඉක්මවා යා හැකි නිර්මාණයක් ජපානයේ බිහි වී නැති බවත් ය. එසේ වුවත් මෙය නවකතාවක් ලෙස පවා නම් කළ හැකිදැයි ප්‍රශ්න නගන්නෝ ද වෙති.

ගෙන්ජි කතාහි පළමු නූතන පරිවර්තනය කළ යසනෝ අකිකොට අනුව මුරසකි ලියා ඇත්තේ පොතෙහි පළමු පරිච්ඡේදයේ සිට තිස්තුන් වන පරිච්ඡේදය දක්වා පමණි. එතැන් සිට පනස් හතර දක්වා පරිච්ඡේද සම්පූර්ණ කොට ඇත්තේ මුරසකි ගේ දියණිය දයිනි නොසන්මි විසිනි.

නූතන පරිගණක විශ්ලේෂණය මගින් හෙළි ව ඇත්තේ ගෙන්ජි කතා 45-54 දක්වා පරිච්ඡේද අනෙක් ඒවාට වඩා වෙනස් බවයි. නමුදු මේ වෙනසට හේතුව කතුවරිය වශයෙන් වැඩෙත්ම ඇගේ ආකල්ප, දෘෂ්ඨිය හා ලේඛන ශෛලිය වෙනස්වීම විය හැකි ය.

මේ කතා පුවත හිකරු ගෙන්ජි නැමැත්තා වටා වර්ධනය වේ. හිකරු ගෙන්ජි යනු ජපාන අධිරාජයා ගේ දෙවැනි පුතා ය. ගෙන්ජි ගේ මව ඔහු ලාබාල අවධියේම මිය යයි. ඉන්පසු පියා ලාබාල කුමරියක සරණ පාවා ගනී. පළමුවෙන් ම ගෙන්ජි මේ කුමරිය වෙත ළං වන්නේ කුඩම්මා කෙනෙකු වෙත දක්වන සෙනෙහසිනි. පසුව ඔවුහු ආදරයෙන් බැඳෙති. සිදුවූ දෙය ගැන ගෙන්ජි ශෝක වෙයි. ඒ නිසා ඔහු ඇය හා සබඳතා පවත්වන අතරම වෙනත් ස්ත්‍රීන් රැසක් සමඟ සබඳතා ගොඩ නඟා ගනී.

ගෙන්ජි කියතම වෙත ගමන් ගන්නා අතර එහිදී ඔහුට වයස අවුරුදු 12ක දැරියක් මුණ ගැසේ. නමින් මුරසකි වන මේ දැරිය තම කුඩම්මා ගේ ලේලියක බව ඔහුට දැනගන්නට ලැබේ. ගෙන්ජි මුරසකි පැහැර ගෙන ගොස් ඇති දැඩි කරයි. ඒ පසු කලෙක විවාහ කර ගැනීමේ අරමුණෙනි. මේ කාලය අතරතුරේදීත් ගෙන්ජි තම කුඩම්මා වන ෆුජිට්සුබෝ සමඟ ලිංගික සබඳතා පවත්වයි. ෆුජිට් සුබෝ ගෙන්ජි ගෙන් පුතෙකු ලබයි. එහෙත් ලෝකයා හමුවේ ඇය පවසන්නේ ඒ දරුවා අධිරාජයා වන ගෙන්ජි ගේ පියා ගේ බවයි.

මේ වනවිට ගෙන්ජි විවාහ වී සිටින්නේ අඔයි (Aoi) ආර්යාව සමඟ ය. ඇය පුතකු ප්‍රසූත කිරීමෙන් පසු මිය යයි. මේ අවස්ථාවේදී ගෙන්ජි මුරසකි සමඟ විවාහ වෙයි. ගෙන්ජි ගේ පියා මිය යන අතර ඔහු ගේ දේශපාලන සතුරෙකු වන දකුණේ ඇමතියා බලයට පත් වේ. ගෙන්ජිගේ තවත් රහස් සම්බන්ධයක් හෙළිවන්නේ මේ අතරතුරේදී ය. එය නම් ගෙන්ජි ගේ සොහොයුරා ගේ බිරිඳ සමඟ පවත්නා ආලයයි. මේ අවස්ථාවේදී ගෙන්ජි දඬුවම් ලෙස හරිමා පළාතට පිටුවහල් කෙරේ. එහිදී ගෙන්ජි අකාෂි නැමැත්තා ගේ දියණිය සමඟ සබඳතාවක් අරඹයි. ඔහු ගෙන් ඇයට දියණියක ලැබේ. රජු ගෙන්ජිට සමාව ප්‍රදානය කරන්නට තීරණය කරන අතර ඔහු යළි අගනුවරට පැමිණේ. නව රජු ව සිටින රෙයිෂෙයි තමා ගේ සැබෑ පියා ගෙන්ජි බව දැන ගෙන ඔහු ඉහළ තනතුරකට පත් කරයි. ගෙන්ජි තවත් විවාහයක් කර ගන්නා අතර මුරසකි මහණ වෙයි.

පසුව මුරසකි මිය යයි. ඊළඟ පරිච්ඡේදයේ ඇතුළත් වන්නේ මබොරොෂි (මායාව) ය. එහි දී ගෙන්ජි ජීවිතය ගැන කළකිරී සිටින අයුරු විස්තර කෙරේ. මබොරොෂි පරිච්ඡේදයෙන් පසු ඇරඹෙන්නේ කුමගකුයේ (වලාකුළු වෙත අතුරුදන්වීම) නම් වූ පරිච්ඡේදයයි. එම පරිච්ඡේදය හිස් ව තබා ඇත. එහෙත් එමඟින් ඇඟවෙන්නේ ගෙන්ජි ගේ මරණයයි. ඉන්පසු ඇත්තේ උජි නමැති පරිච්ඡේදයයි. මෙහි දී කඔරු (kaoru) නම් චරිතයක් ගැන විස්තර කෙරේ. ඒ චරිතය වීර චරිතයකි.

ගෙන්ජි නිසි අවසානයක් නොමැති කතාවක් බව ඇතැමුන් ගේ අදහසයි. ඇතැමෙකු පවසන්නේ අවසාන පිටු කිහිපය හෝ පරිච්ඡේදය අතුරුදහන් වී ඇති බවයි. මෙය විවෘත අවසානයක් ඇති (open end) අපූර්ව නිර්මාණයක් බව ද තවත් මතයකි. නමුදු ලොව ප්‍රථම නවකතාව ලෙස සැලකෙන මේ කතාව මෙතරම් නිර්මාණශීලී වීම අගයනු වටී. ■

**දුලාංජලී එස්. රාමනායක**